"මට ඊයෙ නිමන්ත හමුවුණා.." ඔහු කීවේ ය. "..ඔයා දන්නව ඇති.. ඩොක්ටර්ස්ලට ඕනෙ වෙලා තියෙනවා ඔයාගෙ ට්‍රිට්මන්ට්ස් වල ඊළඟ ස්ටෙප් එකට යන්න.. ඔහු කතාව මඳක් නවතා බලාසිටියේ ය. .. කීමොතෙරපි.. ඔයාට ඩොක්ටර් ඒ ගැන කිව්ව නේද..?"

අමන්දි පිළිතුරක් නොදුන්නා ය. රෝගයට එරෙහිව යොදා ගත හැකි ප්‍රබලම අවියකින් පහර දෙන්නට තමන් සූදානම් බව වෛද්‍ය සිරිමාන්න අමන්දිට කීවේ මෙයට සතියකට පමණ පෙරදී ය. කීමෝතෙරපි ප්‍රතිකාරයේ අතුරු ඵල පිළිබඳව ද ඔහු විස්තර කළේ ය.

"මගේ කෙස් හැළිලා දර ඉපලක් වගේ කෙට්ටු වෙලා ඉන්නවා දකින්න ඔයා කැමතිද..?" බොහෝ වේලාවකට පසු ඈ ඇසුවා ය.

"ඒ හැම දෙයක්ම තාවකාලිකයි.. ට්‍රිට්මන්ට්ස් වලින් පස්සෙ ආයෙම ඒ හැම දෙයක්ම ප්‍රකෘති තත්වයට එනවා.."

"වෙන්න ඇති.." ඈ ඔහු වෙතින් මෑත්ව වඩාත් නිදහස් ඉරියව්වකට මාරු වෙමින් කීවා ය. "..ඒත් මගේ ආදරණීය ගුරුතුමා මං කිසිම අලුත් ට්‍රිට්මන්ට් එකකට යන්නෙ නැහැ.. දැං මට මේ ඔක්කොම ඇති වෙලා..

ඇඳේ ඇලවීගත්වන ම අත දිගු කර තමා මහත් උනන්දුවෙන් නිම කළ සිත්තම අතට ගත් අමන්දි විසල් තෘප්තියකින් එය නැරඹුවා ය. ඇගේ සිත්තමේ කෙළවරක කුඩා කඳුගැටය මත නැගී සිටි හුදකලා ගස දෙස ඇය බොහෝ වේලාවක් බලා සිටියා ය.

දෙවය මට උරුම කරල දෙන දෙයක් බාරගන්න දැන් මං ලෑස්තියි.. ඒක බලහත්කාරයෙන් වෙනස් කරන්න මං උත්සාහ කරන්නෙ නැහැ.."

"මුරණ්ඩු වෙන්න එපා..." ඔහු ඇගේ මුහුණට එබී කීවේ ය. සිය දෙදර මත රැඳි ඔහුගේ දෑත් වෙවුළුණු ඇයට දැනුණි. "..මුරණ්ඩු වෙන්න එපා.." ඈ උරහිස ගස්සා ඔහුගේ දෑත් ඉවත් කළා ය.

"මුරණ්ඩු වෙන්න එපා.." ඔහු නැවතත් කීවේ ය. "..මතක තියාගන්න.. ඔයාගෙ ජීවිතේ ඔයාගෙ විතරක් නෙවෙයි.. ඔයා නිසා.. ඔයා වෙනුවෙන් විඳවන අය තවත් ඉන්නව කියන එක අමතක කරන්න එපා.."

සරදම් සිනාවක් පෑ අමන්දි වාඩිවී සිටි තැනින් නැගිට්ටා ය. ඊසලය වෙතට ගිය ඈ කැන්වසය මත මහත් ඕනෑකමකින් තීන්ත තැවරුවා ය. ඈත මිටියාවතේ පැතිර ගොස් තිබූ මීදුම දැන් අඩුවෙමින් ඇත. අරුණාලෝකය හරිත තුරු පත් මත තැවරෙයි.

ඈත කඳුගැටය මත නැගී සිටගත් හුදකලා ගසේ කුඩා අතු සුළඟින් සෙළවෙයි. එතැනට තවත් ගසක් අවශ්‍යම ය. කෙඳිනක හෝ එතැනට ගොස් ඒ අසළින් තවත් ගසක් පැල කළ යුතු යයි විශ්වට සිතෙයි.

"දවසක අපි දෙන්න අතෙන්ට ගිහින් අර ගහ ළඟින් තවත් පැළයක හිටවමු.. එතකොට ඒ කතාව සම්පූර්ණයි.." ඔහු ඇයට කියන්නේ පිළිතුරක් බලාපොරොත්තුවෙන් නොවේ.

දවසේ ඊළඟ හෝරා කීපය කිසිදු විශේෂත්වයකින් තොරව ගෙවී ගියේ ය. අමන්දි එක්තැන් කරගත් සිතින් යුතුව සිත්තම නිම කරමින් සිටියා ය. විශ්ව ඇය අසළම සිට වරින් වර ඇයට අවශ්‍ය උපදෙස් දුන්නේ ය.

දහවල් ආහාරය සඳහා සවස දෙක පමණ වන විට තානායම කරා එන්නට ඔවුනට හැකි විය. ඉක්මණින් ආහාර ගෙන තමා වෙනුවෙන් වෙන් කර තිබූ කාමරයට ගිය අමන්දි මහන්සිය යන තෙක් ඇඳේ ඇළ වී සිටියා ය. මේ මොහොත සුන්දර සිහිනයක් නොවේදැයි ඇය සිතුවා ය. ඇඳේ ඇලවීගත්වන ම අත දිගු කර තමා මහත් උනන්දුවෙන් නිම කළ සිත්තම අතට ගත් අමන්දි විසල් තෘප්තියකින් එය නැරඹුවා ය. ඇගේ සිත්තමේ කෙළවරක කුඩා කඳුගැටය මත නැගී සිටි හුදකලා ගස දෙස ඇය බොහෝ වේලාවක් බලා සිටියා ය. අනතුරුව ඇඳෙන් නැගට ගත් ඈ සිත්තමේ හුදකලා ගස අසළින් ම තවත් එවැනිම වූ ගසක් පින්තාරු කළා ය.

"ඔන්න විශ්ව මං ඔයාට ඕනෙ හැටියටම තවත් ගහක් හිටෙව්වා..." දඟකාර සිතුවිල්ල ඇඟේ මුහුණේ සිනාවක් ඇන්දේ ය.

තානායමට ඔබ්බෙන් ගලා යන ඔයේ හඬට දෑස් පියාගත්වන ම මහත් ඕනෑකමකින් කන්දි සිටි ඇයට ඉතා ඉක්මණින්ම නින්ද ගොස් තිබුණි.

මතු සම්බන්ධයි

වැඩි පිරිසක් අතරට ඔබේ දැන්වීම ගෙනයන්න

සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

03 8707 4604 - 0402 025 516

email

sannasanews@gmail.com / ads.sannasa@gmail.com

33 වන පිටෙන්

පමණ පෙර මා ලද අත්දැකීමක් ද මෙහි ලා සඳහන් කිරීම වැදගත් යැයි සිතුණි.

වයස අවු. 35 * 40 ක පමණ කෙනෙක් හදිසියක් බලවා ගැනීමට මා වෙත පැමිණියේය. කලින් අප හමුවට පැමිණ නැති කෙනකු පැමිණි බොහෝ විට හෙතෙම මා ඉදිරියේ අසුන් ගත් සැනින් තත් කාල කේන්ද්‍රයක් මනසේ ගොඩනගා ගෙන හෙතෙම කෙබඳු කෙනෙක් ද, පැමිණියේ කුමන කරුණක් අරභයා ද යන පූර්ව විනිශ්චයකට එළඹීම ජ්‍යොතිෂඥයන්ගේ සිරිතකි. ඒ මොහොතේ එදා තත්කාල කේන්ද්‍රයේ ආයුධ කාරක, එසේම ගිනි කාරක 16 වන දෙර්කාණාධිපතියා ලග්නයෙහි විය. එහෙයින් ඔබ ළඟ ආයුධයක් වේ දැයි මම ඇසුවෙමි. ඉස්සර මගේ ආරක්ෂාව සඳහා ආයුධයක් පාවිච්චි කළ බව ඔහු කියා නැත. දැනට පරිහරණය කරනවා නොවේ දැයි ඇසූ විට මගේ මෝටර් රථයේ ආයුධයක් ඇති බව කීය. දැනටත් ළඟ එවැන්නක් ඇති බව පෙනෙන බව කී මා මෙයට පෙර සිරබන්ධනගත වීමක් වූයේ දැයි යළි ප්‍රශ්න කළේය. ඔහු එය පිළිගත්තේය. මංකොල්ලයක් නිසාද නැතහොත් වෙනත් අපරාධයක් නිසා දැයි ප්‍රශ්න කළ විට ඒ කාරණා දෙකටම අදාළ බවක් ඔහු කීය.

ඔහු කේන්ද්‍රය බැලීමට පැමිණියේ ඊළඟඒවැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවස්ථාව හොඳ දැයි නිගමනය කර ගැනීමට බවත් මට හැඟී ගියේය. ඒ අවස්ථාවෙන් මොහු මුදා ගත යුතු බවත් මට හැඟුණි.

වහාම පදිංචි පෙදෙසින් ඈත් ව කලක් නොසිටියොත් යළිදු එබඳු අවදානම් අත්දැකීමකට ඉඩ ඇති බව මා කී පමණින්, ඇති මට දැන ගන්නට වුවමනා එපමණ යැයි කී හෙතෙම ලොකු මුදල් නෝට්ටුවක් මේසය මත තබා ඉවත් විය. ඒ මොහොතේ මගේ කාර්යාලයේ සිටි සහායකයා ඔහු කෙරෙහි අවධානය යොමු කරමින් සිට කෝටියක් පමණ වටිනාකමක් ඇති වාහනයකින් පැමිණි කෙනකු බව මට කීය.

පැරැණි පොත පතේ සඳහන් ග්‍රහ පිහිටීම්වල ප්‍රතිඵල ඈත් එසේම වුවත් කාලීන වශයෙන් වෙනස්කම් දක්නා ලැබේ. ඔබ ඔටුවකුගේ පිටින් වැටී මිය යතැයි පරණ පොතේ කී දෙය අද ඔබ මෝටර් බයිසිකලයකින් වැටී යන අයුරින් වෙනස් විය යුතුය. එසේ නොවුණු විට අනාවැකිය උපහාසයට ලක් විය හැකිය.

මගේ මිත්‍ර ජ්‍යොතිෂවේදියකුට එබඳු අවස්ථාවකට මුහුණ දෙන්නට සිදුවිය. ඔහු වෙත තත්කාල නිමිත්තක් බලන්නට පැමිණි කෙනකුට ඔබේ ගන්ධාරයක් හොරුන් විසින් පැහැර ගෙන ඇති බවක් කීවේය. ඇත්ත වශයෙන්ම ඔහුගේ නැති වී ඇත්තේ සිය මෝටර් රථයේ ශබ්ද සංඥා දෙන උපකරණයකි. පැරැණි ජ්‍යොතිෂවේදීන් අපූරු අනාවැකි හෝ ලත් අත්දැකීම් ගැන පලාපල කීවේ පැරැණි පොත පතේ එන සිද්ධාන්ත අනුවය. වත්මන් පොත පත කියවා නැති අය බොහෝ විට ග්‍රහයකුගේ හෝ රාශියක ස්වභාවය හඳුනා නොගෙන දශාව ලබා ඇති ග්‍රහයාගේ කාරක ගුණය පමණක් මුල් කර පලාපල කීම නිසා බොහෝ වැදගත් කරුණු මගහැරී යයි. ගොළු රාශි, අන්ධ රාශි, ශබ්ද රාශි, වඳ රාශි හෝ ග්‍රහයකුගේ මුඝ බව නැකතකින් හෝ දෘෂ්ටියකින් ඒ ග්‍රහයා දූෂණය වී ඇති බව වැනි කරුණු කෙරෙහි යොමු වන්නට ගුරු ඇසුරට යොමු විය යුතුය. ප්‍රවීණ ගුරුවරයකු ගේ ඇසුරක් මග පෙන්වීමක් නැතිව කෙනකුට සාර්ථක ජ්‍යොතිෂවේදියකු විය නොහැකිය. බොහෝ විට හස්තසාර දැනුම ඇත්තේ පරිණත ජ්‍යොතිෂවේදියාගේ මනසේය. ඔහු එය හැම දෙනාටම නොදෙයි. තමාගේ ඉතා හිතවත් ගුරු බැතිය ඇති ගෝලයාට හෝ තම දරුවකුට පමණක් එය ලබා දෙන සම්ප්‍රදායක් සමාජයේ පවතී. නිදසුනක් වශයෙන් සියපත් හෝරාව පිළිබඳවත්, ආරූඪ ලග්නයේ ග්‍රහයන් පිහිටුවන අයුරු පිළිබඳවත් පත පොතේ

දැක්වෙන අරුතට වඩා වෙනස් විග්‍රහ කිරීම් ඇතැම් ශාස්ත්‍ර වන්තයන් කෙරෙහි වෙයි. පියාගෙන් පුතාට පමණක් ලබා දෙන ගුරු මුෂ්ටි ක්‍රම නිසා බොහෝ සිද්ධාන්ත සමාජයට නොලැබී ගියේය.

හැම කරුණක් සඳහා ම පර්යේෂණ මධ්‍යස්ථානයක් ඇති අපේ රටේ ජ්‍යොතිෂයට පමණක් පර්යේෂණ මධ්‍යස්ථානයක් නැත. ඒ නිසා කාලීන සිදුවීම් රැස්කර එම වාර්තා ගබඩා කර ගෙන තබා ගන්නා ක්‍රමයක් නැත. නිදසුනක් වශයෙන් සුනාමිය වැනි සිදුවීමක් හා එයට පෙර එවැන්නක් සිදු වූ අවස්ථාවක් ගැන වාර්තා ගබඩා කර ගෙන නැති නිසා නැවත එවැන්නක් සිදු විය හැකි වකවානුවක් ගැන ග්‍රහචාරය ඔස්සේ පරීක්ෂා කර බැලීමට පුළුවන්කමක් නැත. අපේ පැරැණි රජවරුන්ගේ ජන්ම කේන්ද්‍ර, පවා පරණ පුස්කොළ පොත්වල කොතුකාගාරයේ ඇත. ඒවා සංරක්ෂණය කිරීමට හෝ ග්‍රන්ථගත කිරීමට උනන්දුවක් කාටවත් නැත්තේ ජ්‍යොතිෂ පර්යේෂණාගාරයක් අපට නැති නිසාය. විදේශිකයන් අපෙන් පැහැර ගෙන ගිය බොහෝ ජ්‍යොතිෂ පුස්කොළ පොත් අදත් ඔවුන්ගේ කොතුකාගාරවල තිර වී ඇත. ඒවා ආපසු ලබා ගැනීමට කිසිවකුට උනන්දුවක් ද නැත. ජ්‍යොතිෂය පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යැමේ වගකීම ඇත්තේ සංස්කෘතික අමාත්‍යංශයට යැයි සිතමි.

වත්මන් ජ්‍යොතිෂවේදියා, කෙනකුගේ හදිසියක් බලා ප්‍රතිඵල කීමට හෝ නැකතක් හදා දීමට පමණක් සීමා නොවී යම් යම් පර්යේෂණවලට ද නැඹුරු වන්නේ නම් මහත් ප්‍රතිඵල ලබා ගත හැකි වෙයි.

බන්ධනාගාරගත වූ හෝ පිළිකා වැනි බියකරු රෝග වලට භාජන වූ සිය ගණනකගේ කේන්ද්‍රවල පිහිටි, එකී තත්ත්වය මතු කිරීමට හේතු වූ ග්‍රහ පිහිටීම් මොනවා දැයි විමසා බැලීමට මම කාලයක් මිඩංගු කෙළෙමි. එදා වරහමිහිර ආචාරීන් විසින් ඒ පිළිබඳව යම් සිද්ධාන්තයක් දුන්නේ නම් එය අකුරටම නිවැරැදි බව අපට පෙනී ගියේය. ඒ දැනුම ජ්‍යොතිෂවේදියා ප්‍රගුණ කර ගන්නේ නම් රෝගයක් හෝ අනියම් ආපදාවක් සිදු වන්නට කලින් එය හඳුනා ගැනීමේ ශක්තියක් ජ්‍යොතිෂවේදියාට ලැබෙනු ඇත. ඒ කාර්යය එකී පුද්ගලයකුට හෝ දෙතුන්දෙනකුට පමණක් කළ හැකි එකක් නොවේ. ජ්‍යොතිෂ පර්යේෂණය පිළිබඳ ඒකකයකින් පමණක් කළ හැකි එකකි.

ජ්‍යොතිෂයට පමණක් නොව දේශීය ආයුර්වේදයට ද අසාධාරණකම් සිදු වූ අවස්ථා බොහෝය. බටහිර වෙදුන්ගේ බෙහෙත් කරල විකුණා ගැනීමට අවශ්‍ය නිසා අප දිගු කාලයක් ප්‍රයෝජනයට ගත් රත කල්කයට අරියාදුජ්කිරීම එයට හොඳ එක් නිදසුනකි. ජ්‍යොතිෂය අනාගතය උදෙසා රැක ගත යුතුය. එසේම ජ්‍යොතිෂවේදියාත් රැක ගත යුතුය. අපේ පැරැණි ජ්‍යොතිෂ පත පොතත් රැක ගත යුතුය. ජ්‍යොතිෂය අනාගත විශ්වවිද්‍යාල විෂයක් විය යුතු හෙයින් එය පාසලට ඇතුළු කළ යුතුය.

යටත් පිරිසෙයින් ජ්‍යොතිෂය ඉගෙනීමට කැමැත්තක් ඇති අයගේ ප්‍රයෝජනය සඳහා සියල්ලන්ටම පොදු ජ්‍යොතිෂ පාඨමාලාවක් හෙවත් පාඨ මාර්ගයක් සකස් කර තැබීමට සංස්කෘතික අමාත්‍යංශය වග බලා ගත යුතු යැයි සිතේ. දැනට ජීවතුන් අතර සිටින වයෝවෘද්ධ පරිණත ජ්‍යොතිෂවේදීන් දැයෙන් සමු ගැනීමට පෙර එය කර නොගතහොත් ජාතික උරුමකම්වලින් කොටසක් ජාතියට අහිමි විය හැකිය.

ආචාර්ය පියසේන රතුවිතාන
අනුග්‍රහය දිවයින